සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2021
ஆண்டு இறுதி மதிப்பீடு
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper | 1 | පැය / மணித்தியாலம் / Hours | 01 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

❖ පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක 1සිට 5තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චතුරිකා සහ මොනිකා පාසල් කාලයේ සිට සමාන අදහස් ඇති මිතුරියන් දෙදෙනෙකි. රැකියාවක් කිරීමට අකමැති යෙහෙළියන් දෙදෙනා එක්ව නගරයේ පළතුරු බීමහලක් පවත්වාගෙන ගියෝය. සෞඛ්‍ය ආරක්ෂිතව මෙම බීම සකස් කර ප්‍රනීත රසයකින් යුක්තව අලෙවි කරන නිසා පාරිභෝගිකයන් වැඩි පිරිසක් ඔවුන්ගේ ව්‍යාපාරය සමග නිතර ගනුදෙනු කරති. මෙම ව්‍යාපාරය "චතු ෆෲට්ස්" නමින් නම් කර තිබුණි.

01. චතුරිකා සහ මොනිකා ආරම්භ කළ මෙම ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් අවශ්‍යතාව කුමක්ද?
1. ආහාර 2. අධ්‍යාපනය 3. සෞඛ්‍ය 4. ආරක්ෂාව

02. මෙම ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන විශේෂය වන්නේ,
1. ඒකපුද්ගල ව්‍යාපාර ය. 2. හවුල් ව්‍යාපාර ය. 3. සංස්ථාපිත සමාගම ය. 4. සමුපකාර ය

03. චතු ෆෲට්ස් ව්‍යාපාරය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. මෙම ව්‍යාපාරයේ වගකීම සීමිත වේ.
2. මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
3. මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු ය.
4. මෙම ව්‍යාපාරයට අඛණ්ඩ පැවැත්මක් ඇත.

04. ඉහත සිද්ධියට අයත් පළතුරු බීම සකස් කරන යන්ත්‍ර අයත්වන නිෂ්පාදන සාධකය කුමක්ද?
1. භූමිය 2. ශ්‍රමය 3. ප්‍රාග්ධනය 4. ව්‍යවසායකත්වය

05. ඉහත සිද්ධියේ සඳහන් ව්‍යාපාරයට ඇල්මැති පාර්ශ්වයක් ලෙස පළතුරු සැපයුම්කරුවන්ගේ අරමුණ වන්නේ,
1. ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම ය.
2. නිෂ්පාදිත සාධාරණ මිලට ලබා ගැනීම ය.
3. සාධාරණ වැටුප් ලබා ගැනීම ය.
4. අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම ය.

06. යම් රටක රජයක් ආර්ථික කටයුතු මෙහෙයවීමේ දී අනුගමනය කරන ප්‍රතිපත්ති අයත්වන පරිසරය,
1. ආර්ථික පරිසරයයි. 2. දේශපාලන පරිසරයයි. 3. නෛතික පරිසරයයි. 4. ගෝලීය පරිසරයයි.

07. හවුල් ව්‍යාපාරයක අවම හා උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව නිර්ණය කර ඇති පනත වන්නේ,

1. 2007 අංක 7 සමාගම් පනත ය.
2. 1890 හවුල් ආඥා පනත ය.
3. 1918 ව්‍යාපාර නාම ආඥා පනත ය.
4. 1972 අංක 05 සමුපකාර පනත ය.

08. රාජ්‍ය සංස්ථාවක විශේෂයක් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

1. ලාභය මහජනතාව සතුවීම.
2. අයිතිය හා පාලනය රජය සතුවීම.
3. නෛතික පුද්ගලභාවයක් තිබීම.
4. අඛණ්ඩ පැවැත්මක් තිබීම.


09. පහත දැක්වෙන්නේ සිල්ලර වෙළෙඳාම සම්බන්ධ වගන්ති කිහිපයකි.

A. අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම.
B. අලෙවියට තබා ඇති නව භාණ්ඩ හඳුන්වා දීම.
C. පාරිභෝගිකයාට සමීප වීම.
D. ඇතැම්විට ණයට භාණ්ඩ සැපයීම.

ඉහත සිදුවීම් තුළින් සිල්ලර වෙළෙඳාමේ වැදගත්කම් පමණක් ඇතුළත්වන නිවැරදි පිළිතුර තෝරන්න.

1. A හා C  2. B හා C  3. B හා D  4. A හා D

10. පහත දැක්වෙන්නේ චෙක්පත් රේඛන අවස්ථා කිහිපයකි.




A  B  C  D

ඉහත රේඛන අවස්ථා අතුරෙන් චෙක්පතට ඉහළම ආරක්ෂාවක් ලබා දී ඇති රේඛණ අවස්ථාව වන්නේ,

1. D  2. B  3. C  4. A

11. හානිපූරණ මූලධර්මය අදාළ <u>නොවන</u> රක්ෂණ ඔප්පු විශේෂය වන්නේ,

1. මාර්ගස්ථ මුදල් රක්ෂණ ඔප්පුව ය.
2. මෝටර්රථ රක්ෂණ ඔප්පුව ය.
3. ජීවිත රක්ෂණ ඔප්පුව ය.
4. ගිනි රක්ෂණ ඔප්පුව ය.

12. විද්‍යුත්, වාචික, ලිඛිත යන සන්නිවේදනයේ ස්වරූප සඳහා වඩාත්ම ගැලපෙන සන්නිවේදන මාධ්‍ය වන්නේ,

1. විද්‍යුත් තැපැල ය.  2. ස්කයිප් ය.  3. දුරකථන සංවාද ය.  4. ඩිජිටල් පුවරු ය.

13. ගුවන් සමාගමක් විසින් නව ගුවන් යානා මිලට ගැනීම අයත්වන ප්‍රවාහන මූලිකාංගය වන්නේ,

1. මාධ්‍යය ය.  2. මාර්ගය ය.  3. බලය ය.  4. පර්යන්තය ය.

4. මානව සම්පත සඳහා අවශ්‍ය තොරතුරු හා උපදෙස් ලබා දෙමින් අදාළ කාර්යයන් සඳහා පෙළඹවීම,

1. සැලසුම් කිරීමයි.  2. සංවිධානකරණයයි.  3. මෙහෙයවීමයි.  4. පාලනයයි.

15. අලෙවිකරණ මිශ්‍රයට ඇතුළත් ''නිෂ්පාදිතය'' යන විචල්‍යයට අදාළ අයිතම වන්නේ,
   1. ගුණත්වය, වට්ටම්, ප්‍රවාරණය හා ඇසුරුම ය.
   2. මෝස්තරය, ඇසුරුම, අංගෝපාංග හා ගුණත්වය ය.
   3. ලැයිස්තුගත මිල, ස්ථානය, ඇසුරුම හා ප්‍රවාරණය ය.
   4. දිමනා, ප්‍රවාහනය, මෝස්තරය හා ගබඩා කිරීම ය.

16. භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධ පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. වැඩි මිලකට අලෙවි කිරීමෙන් ප්‍රාග්ධන ලාභ ලබා ගත හැකි ය.
   2. ස්ථාවර ප්‍රතිශතයක් යටතේ පොලී ආදායම් හිමි වේ.
   3. ඡන්දය භාවිත කර අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමේ හැකියාව.
   4. වර්ෂය අවසානයේ ලාභාංශ ආදායම් හිමිවීම.

17. වත්කම් දෙකක වෙනස්වීමට බලපාන ගනුදෙනුව තෝරන්න.
   1. බැංකු ණයක් ගත්තා රු. 25 000
   2. භාණ්ඩ තොග ණයට ගත්තා රු. 40 000
   3. යන්ත්‍රයක් මිලදී ගත්තා රු. 80 000
   4. විදුලි ගාස්තු ගෙව්වා රු. 8 000

18. වැඩිවීම බැර, අඩු වීම හර යන ගිණුම්කරණ මූලධර්ම ඇතුළත් ගිණුම් වර්ග අයත් කාණ්ඩය වන්නේ,
   1. වත්කම් ගිණුම් හා ආදායම් ගිණුම්
   2. ආදායම් ගිණුම් සහ වගකීම් ගිණුම්
   3. වත්කම් ගිණුම් හා වියදම් ගිණුම්
   4. වියදම් ගිණුම් හා ආදායම් ගිණුම්

19. ලෙජරයේ ඇති ණයගැති ගිණුම ① වන අතර දුන් වට්ටම් ගිණුම ②වේ.
ඉහත ① සහ ② ස්ථානවලට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,
   1. වත්කම් ගිණුමක් - වියදම් ගිණුමක්
   2. වත්කම් ගිණුමක් - වගකීම් ගිණුමක්
   3. හිමිකම් ගිණුමක් - ආදායම් ගිණුමක්
   4. වගකීම් ගිණුමක් - වියදම් ගිණුමක්

20. මෝටර් රථ අලෙවි කිරීමේ ව්‍යාපාරයන් පවත්වාගෙන යන නිලූකා ලියනාරච්චි තම ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් ඉදිරිපත් කර ඇත.

- රාමනායක මෝටර්ස් වෙතින් නවීන මෝටර් රථ දෙකක් ණයට ගැනීම.
- රු. 6 500 000 ක් වටිනා මෝටර්රථයක් චාන්දනීට ණයට විකිණීම.
- ව්‍යාපාරයට රු. 8 000 000ක් වටිනා ඉඩමක් මිලට ගැනීම.

ඉහත ගනුදෙනු සටහන් කළ යුතු මූලික සටහන් පොත් පිළිවෙලින් තෝරන්න.

   1. ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, විකුණුම් ජර්නලය
   2. පොදු ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් පොත
   3. මුදල් පොත, ගැනුම් ජර්නලය, විකුණුම් ජර්නලය
   4. ගැණුම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් පොත

21. බැංකු ප්‍රකාශනයක හර ශේෂයෙන් හෙළිදරව් කෙරෙන්නේ,
   1. ව්‍යාපාරයේ බැංකු අයිරාවක් ඇති බව ය.
   2. ව්‍යාපාරයට වත්කමක් ඇති බව ය.
   3. ව්‍යාපාරයේ වගකීමක් නැති බව ය.
   4. බැංකුවට වත්කමක් ඇති බව ය.

22. වතුරගෙන් ලැබිය යුතු ණය මුදල රු. 10,000කි. වතුර රු.8500ක චෙක්පතක් එවීමෙන් ඔහුගේ ණය පියවුණි. එම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1. මුදල් පොත හර 8500
   දුන් වට්ටම් හර 1500
   වතුරගේ ගිණුම බැර 10 000
2. මුදල් පොත හර 10 000
   වතුර ගිණුම බැර 8500
   ලද වට්ටම් ගිණුම බැර 1 500
3. මුදල් පොත හර 10 000
   වතුරගේ ගිණුම බැර 10 000
4. වතුරගේ ගිණුම හර 8 500
   බැංකු ගිණුම බැර 8500

23. සරාගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් A තිරුවේ ද ව්‍යාපාරය පවත්වාගෙන යන මූලික පොත් B තිරුවේ ද දැක් වේ.

| A | B |
|---|---|
| 1. භාණ්ඩ තොග ණයට විකුණුම | a.පොදු ජර්නලය |
| 2.බුද්ධිකට ණයට විකුණුම | b.ගැනුම් ජර්නලය |
| 3.බොල්ණය කපා හැරීම | c.විකුණුම් ජර්නලය |

A හා B තිරුව නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

1. a,c,b
2. a,b,c
3. c,a,b
4. b,c,a

❖ **පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 24 හා 25 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ලලනිගේ ව්‍යාපාරයේ 2022.01.31 සුළු මුදල් භාරකරු ළඟ ඉතිරි මුදල රු. 800කි. 2022 පෙබරවාරි මාසයේ සුළු මුදල් විශ්ලේෂණ තීරුවල ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| ගමන් වියදම් | රු. 1200 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | රු. 2600 |
| සංග්‍රහ වියදම් | රු. 1400 |
| දනන්සූරියට ගෙවීම් | රු. 4000 |

24. මෙම ව්‍යාපාරයේ 2022 පෙබරවාරි මාසයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම,

1. රු. 9200
2. රු. 10 000
3. රු. 11400
4. රු. 12000

25. පෙබරවාරි 28 දිනට ලෙජර ගිණුම් තීරුවේ අවසාන එකතුව වන්නේ,

1. රු. 2600
2. රු. 3800
3. රු. 4000
4. රු. 9200

26. බැංකු ගිණුම සංශෝධනය කිරීමට අදාළ ගනුදෙනුව තෝරන්න.

1. නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 3000
2. ස්ථාවර නියෝග මත බැංකුව ගෙවූ ණයවාරික රු. 5000
3. තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් රු. 2000
4. බැංකුව විසින් ගිණුමට වැරදි ලෙස බැර කර තිබූ මුදල රු. 1000

27. රංගොඩගේ ව්‍යාපාරයේ 2022.01.01 දිනට පහත ශේෂ දක්නට ලැබුණි.

| | රු. |
|---|---|
| යන්ත්‍ර | -200 000 |
| බඩුතොග | - 60 000 |
| ණයගැතියෝ | - 15000 |
| ණයහිමියෝ | - 12 000 |
| මුදල් | - 30 000 |
| බැංකු ණය | - 40 000 |
| උපචිත වියදම් | - 8 000 |

මෙම ව්‍යාපාරයේ 2022.01.01 දිනට හිමිකම වන්නේ,

1. රු. 230 000
2. රු. 237 000
3. රු. 240 000
4. රු. 245 000

28. රු. 3000ක ගැනුම් ඉන්වොයිසියක් පොත්වල සටහන් කිරීම සම්පූර්ණයෙන් මග හැරී ඇත. එය නිවැරදි කිරීමේ ද්විත්ව සටහන වන්නේ,

1. ගැණුම් ගිණුම හර රු. 3000
   අවිනිශ්චිත ගිණුම බැර රු. 3000
2. අවිනිශ්චිත ගිණුම හර රු. 3000
   ණයහිමි ගිණුම බැර රු. 3 000
3. ගැණුම් ගිණුම හර රු. 3000
   ණයහිමි ගිණුම බැර රු. 3000
4. ණයහිමි ගිණුම හර රු. 3000
   ගැණුම් ගිණුම බැර රු. 3000

29. ශේෂ පිරික්සුම තුලනය වීම කෙරෙහි බලපෑමක් ඇති නොකරන දෝෂයක් වන්නේ,

1. රු. 4000ක වැටුප් ගෙවීම වැටුප් ගිණුමේ සටහන් නොවීම.
2. රු. 2000ක විදුලි ගාස්තු ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට පිටපත් නොකිරීම.
3. රු. 6000 කඩකුළී ආදායම් මුදල් පොතේ නිවැරදිව සටහන් කර කඩ කුළී ආදායම් ගිණුමේ රු. 600ක් ලෙස සටහන් වීම.
4. ණයගැතියෙකුගෙන් ලද රු. 3500 පොත් වල දෙවරක් සටහන් වීම.

❖ පහත සදහන් තොරතුරු ඇසුරෙන් අංක 30 හා 31 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- සරුබිම ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200කි. එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500කි. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සරුබිම ක්‍රීඩා සමාජයේ ගිණුම්පොත් වලින් උපුටාගන්නා ලදී.

| | | |
|---|---|---|
| සාමාජික මුදල් ලැබීම් | රු. | 65 000 |
| පරිත්‍යාග ලැබීම් | රු. | 50 000 |
| විදුලි ගාස්තු | රු. | 6 000 |
| ක්‍රීඩා උපකරණ මිලට ගැණුම් | රු. | 8 000 |
| ක්‍රීඩා පිටිය නඩත්තු වියදම් | රු. | 7 000 |
| තරග ආදායම් | රු. | 30 000 |
| තරග වියදම් | රු. | 9 000 |

30. සරුබිම ක්‍රීඩා සමාජයේ 2021.12.31 දිනට ලැබීම් හා ගෙවීම් ගිණුමේ හා ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කළයුතු සාමාජික මුදල් ප්‍රමාණය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

1. රු.65 000 හා රු.100 000
2. රු.35 000 හා රු. 100000
3. රු.100 000 හා රු. 65000
4. රු. 35 000 හා 65000

31. සරුබිම ක්‍රීඩා සමාජයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය වන්නේ,

1. රු. 150 000 2. රු. 158 000 3. රු. 170 000 4. රු. 185 000

❖ පහත සදහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 32 සිට 34 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

යශෝධා ලී බඩු නිෂ්පාදකයන්ගේ පොත්වලින් උපුටාගත් 2022 ජනවාරි මාසයේ තොරතුරු පහත දැක් වේ.

| | | |
|---|---|---|
| දැව මිලට ගැණුම් | රු. | 53 000 |
| ඇණ හා පොලිෂ් | රු. | 8 000 |
| සුපරික්ෂක වේතන | රු. | 15 000 |
| වඩු කාර්මික වැටුප | රු. | 14 000 |
| කම්හල් කුළී | රු. | 4 000 |
| ඉන්ධන හා විදුලිය | රු. | 6 000 |

ජනවාරි මාසයේ නිපදවූ අල්මාරි ගණන 10කි.

32. යශෝධා ලී බඩු නිෂ්පාදකයන්ගේ 2022 ජනවාරි මාසයේ ප්‍රාථමික පිරිවැය,

1. රු. 53 000කි. 2. රු. 61 000කි. 3. රු. 67000කි. 4. රු. 68 000කි.

33. මෙම ව්‍යාපාරයේ පොදු කාර්ය පිරිවැයෙහි මුළු වටිනාකම වන්නේ,

1. රු. 10 000 2. රු. 19 000 3. රු. 25000 4. රු. 33 000

34. එක් අල්මාරියක් රු. 12500කට අලෙවි කළේ නම් මෙම ව්‍යාපාරය පිරිවැය මත තබාගෙන ඇති ලාභාන්තිකය වන්නේ,

1. 10%කි. 2. 20%කි. 3. 25%කි. 4. 30%කි.

❖ පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 35 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කළණගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ගිණුම් පොත්වලින් උපුටාගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| තොගය (2021.01.01දිනට) | 25 000 |
| විකුණුම් | 250 000 |
| ගැනුම් | 140 000 |
| ගෙනල්මේ කුළී | 7 000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | 400 000 |
| ඉඩම් හා ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම (2021.01.01 දිනට) | 40 000 |
| විදුලි ගාස්තු | 8 000 |
| දුන් වට්ටම් | 2 000 |
| ලද වට්ටම් | 5 000 |
| ණයගැතියෝ | 20 000 |
| ණයහිමියෝ | 12 000 |
| ප්‍රචාරණ වියදම් | 6 000 |
| බැංකු අයිරාව | 25 000 |
| මුදල් ශේෂය | 10 000 |
| ප්‍රාග්ධනය | 500 000 |

අතිරේක තොරතුරු,

- ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කල යුතු ය.
- 2021.12.31 දිනට ඉතිරි තොගය රු. 20 000
- ප්‍රචාරක වියදම් රු. 1 000 ගෙවිය යුතු ය.

35. මෙම ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වන්නේ,

1. රු. 152 000 2. රු. 165 000 3. රු. 172 000 4. රු. 192 000

36. මෙම ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වන්නේ,

1. රු. 90 000 2. රු. 98 000 3. රු. 125 000 4. රු. 140 000

37. මෙම ව්‍යාපාරයේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය වන්නේ,

1. රු. 38 000 2. රු. 46 000 3. රු. 57 000 4. රු. 62 000

38. මෙම ව්‍යාපාරයේ 2021.12.31 දිනට ඉඩම් හා ගොඩනැගිලිවල ධාරණ අගය කොපමණද?

1. රු. 40 000 2. රු. 80 000 3. රු. 260 000 4. රු. 320 000

39. කළණගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මුළු ජංගම වගකීම්වල වටිනාකම,

1. රු. 38 000 2. රු. 41 000 3. රු. 46 000 4. රු. 50 000

40. කළණගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මුළු වත්කම්වල වටිනාකම,

1. රු. 340 000 2. රු. 370 000 3. රු. 400 000 4. රු. 460 000

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

සැලකිය යුතුයි.
පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
ආහාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු වන ධම්මික විතානගේ ව්‍යාපාර අවස්ථා පිළිබඳ නිතර විමසිලිමත් විය. ජනතාවගේ කාර්යය බහුලත්වය සලකා බලා, පිරිසිදුව හා ගුණත්වයෙන් ඉහළ නැවුම් එළවළු, පළා වර්ග කපා, පැකට් කර අග නගරය ආශ්‍රිතව නිවෙස්වලට ගොස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2021 ජුනි 01 දින "ග්‍රීන් වෙජී" නමින් ආරම්භ කරන ලදී. ධම්මික රු. 200 000ක් මුදලක් ද රු. 800 000 වටිනා ලොරි රථය ද ව්‍යාපාරයට යොදන ලදී. ව්‍යාපාරයට අවශ්‍ය සාමාන්‍ය සේවකයෙකු හා රියදුරෙකු බඳවා ගන්නා ලදී. ආකර්ෂණීය ඇසුරුම් හ පිරිසිදු බවින් හෙබි විවිධ හැඩතල අනුව එළවළු කපා ඇසුරුම් කිරීම නිසා අගනුවර ගෘහණියන්ගේ විශ්වාසය ඉක්මණින්ම ලබා ගැනීමට හැකි විය. 2021 ජුනි 01 දින රු. 50 000ක බැංකු ණයක් ද ලබාගෙන ඇත.

2021 ජුනි මාසයේ එළවළු පැකට් නිෂ්පාදනයට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

| | | |
|---|---|---|
| එළවළු මිලදී ගැනුම් | රු. | 380 000 |
| පලා වර්ග මිලට ගැනුම් | රු. | 20 000 |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැනුම් | රු. | 10 000 |
| කැපුම් යන්ත්‍රයක් මිලට ගැනුම් | රු. | 25 000 |
| සේවක වැටුප් ගෙවීම (මාසික) | රු. | 10 000 |

2021 ජුනි මාසයේ එළවළු පැකට් බෙදහැරීමේ වියදම්

| | | |
|---|---|---|
| ඉන්ධන වියදම් | රු. | 12 000 |
| රියදුරු වැටුප් ගෙවීම් | රු. | 20 000 |

ලොරි රථය වාර්ෂිකව 12% බැගින් ද ව්‍යාපාරයේ ඇති යන්ත්‍ර වාර්ෂිකව 6% බැගින් ද සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය. ව්‍යාපාර ගනුදෙනු ක්‍රමවත් කිරීම සඳහා ජංගම ගිණුමක් ආරම්භ කිරීමට ද තීරණය කර ඇත. එළවළු පැකට්ටුවක එළවළු වර්ග 3ක් ඇතුළත් වන අතර එක් වර්ගයකින් 200g බැගින් ඇතුළත් කර ඇත. මෙම එළවළු පැකට් එකක මිල රු. 150/-වන අතර පලා වර්ග පැකට්ටුවක මිල රු. 50/-කි. ජුනි මාසය තුළ එළවළු පැකට් 4000ක් ද පලා වර්ග පැකට් 2000ක් ද අලෙවි කර ඇත. ජුනි මස අවසානයේ තොග කිසිවක් ඉතිරි නොවීය.

(i) (අ) "ග්‍රීන් වෙජී" ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක්ද?
(ආ) හිමිකාරිත්වය අනුව "ග්‍රීන් වෙජී" ව්‍යාපාරය අයත් වන්නේ කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයටද?

(ii) මෙම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධක දෙකක් නම් කර, එම පාර්ශ්ව ව්‍යාපාරය කෙරෙහි ඇල්මක් දැක්වීමට හේතුව බැගින් ලියන්න. (පිළිතුරු සැපයීමට පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

| පරිසර සාධක | ඇල්මක් දැක්වීමට හේතු |
|---|---|
| | |
| | |

(iii) (අ) මෙම සිද්ධියේ සඳහන් ප්‍රවාහන මාර්ගය හා මාධ්‍ය නම් කරන්න.
(ආ) ග්‍රීන් වෙජී ව්‍යාපාරයේ ශක්තියක් හා අවස්ථාවක් ලියන්න.

(iv) (අ) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අදාළ වන පනත කුමක්ද?
(ආ) ඒක පුද්ගල ව්‍යාපාරයක් හා හවුල් ව්‍යාපාරයක් අතර ඇති සමාන ලක්ෂණ දෙකක් ලියන්න.

(v) (අ) 2021 ජුනි 01 දිනට ග්‍රීන් වෙජී ව්‍යාපාරයේ හිමිකම කොපමණද?
(ආ) 2021 ජුනි 01 දිනට ග්‍රීන් වෙජී ව්‍යාපාරයේ වගකීම කොපමණද?

(vi) ග්‍රීන් වෙජී ව්‍යාපාරය සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කිරීමේදී පවත්වාගත යුතු මූලික සටහන් පොත් දෙකක් නම් කරන්න.

(vii) (අ) ජංගම ගිණුමක් ආරම්භ කළේ නම් මුදල් හෝ චෙක් තැන්පත් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන ලියන්න.
(ආ) 2021 ජුනි මස 30 දින මුදල් ශේෂය කොපමණද?

(viii) (අ) ලොරි රථයේ 2021 ජුනි මස ක්ෂය ප්‍රමාණය කොපමණද?
(ආ) ලොරි රථයේ ජුනි මස ක්ෂය ප්‍රමාණය සටහන් කිරීමට අදාළ නිවැරදි ජර්නල් සටහන වට්නාකම සහිතව දක්වන්න.

(ix) ග්‍රීන් වෙජී ව්‍යාපාරයේ 2021 ජුනි මාසයේ ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(x) ග්‍රීන් වෙජී ව්‍යාපාරයේ, 2021 ජුනි 30 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණද?
(ලකුණු 2x10 = 20)

## 1 කොටස - ව්‍යාපාර අධ්‍යයනය
(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

02. (i) අ. ව්‍යාපාරයක් යන්න නිර්වචනය කරන්න.
ආ. ව්‍යාපාර අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
අ. මිනිස් අවශ්‍යතා විවිධ වන අතර, වුවමනා පොදු වේ.
ආ. නිෂ්පාදිත සාධාරණ මිලට ලබා ගැනීම ඇල්මැති පාර්ශ්වයක් ලෙස ගනුදෙනුකරුවන්ගේ අරමුණකි.
ඉ. යම් රටක රජයක් විසින් ආර්ථික කටයුතු මෙහෙයවීමේ දී අනුගමනය කරන ප්‍රතිපත්ති ආර්ථික පරිසරය නම් වේ.
ඊ. ප්‍රාග්ධනය සීමිත වීම සමුපකාර සමිතිවල අවාසියකි. (ලකුණු 02)

(iii)මොරටුවේ පදිංචි නයනා තම සේවිකාවගේ ද සහාය ඇතිව නිවසේම පිළියෙල කරන ආහාර පැකට් (බත් පාර්සල්) මොරටුව දුම්රිය ස්ථානය ඉදිරිපිට දිනපතා සවස් කාලයේ දී සහන මිලට අලෙවි කරයි. ඉතා පිරිසිදු හා ගුණත්වයෙන්, රසයෙන් ඉහළ නිසා දුම්රියෙන් බැස එන මගීන් වැඩි පිරිසක් නයනාගේ ආහාර රැගෙන යාම පුරුද්දක් කරගෙන ඇත. නමුත්, ඒ අවට ද ආහාර අලෙවිකරණ හෝටල් කිහිපයක්ම ඇත. එම හෝටල් හිමියන් ද අලෙවි ප්‍රවර්ධන ක්‍රම අනුගමනය කිරීමට පටන්ගෙන ඇත.

අ. නයනාගේ ආහාර අලෙවි කිරීමේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව දෙකක් නම් කරන්න.
ආ. නයනාගේ මෙම ව්‍යාපාරයට ඇති විය හැකි යැයි ඔබ සිතන තර්ජන දෙකක් ලියන්න.
(ලකුණු 02)

(iv) අ. නිෂ්පාදන සාධකයක් ලෙස ව්‍යවසායකත්වය යන්න නිර්වචනය කරන්න.
ආ. රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයක් ලෙස දෙපාර්තමේන්තුවල අවාසි දෙකක් ලියන්න.
(ලකුණු 02)
(මුළු ලකුණු 08)

03. (i) අ. රක්ෂණය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)
ආ. රක්ෂණ මූලධර්ම දෙකක් නම් කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
අ. අලෙවියට තබා ඇති නව භාණ්ඩ හඳුන්වා දීම සිල්ලර වෙළඳාමේ ලක්ෂණයකි.
ආ. ස්ථාවර තැන්පතුවක තැන්පතු කාලය සහ මුදල අනුව පොළී ප්‍රතිශතය වෙනස් නොවේ.
ඉ. විශේෂ රේඛනය සිදු කිරීමේදී වාණිජ බැංකුවක නමක් ඒ තුළ සටහන් වීම අනිවාර්යය වේ.
ඊ. ලංකා බැංකුවේ CEY NET කාඩ්පත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පතකි. (ලකුණු 02)

(iii) රු. 8000 000 වටිනා මෝටර් රථයක් හිමි අතුල උදයංග දෙහිඅත්තකණ්ඩියේ පදිංචිකරුවෙකි. ආරක්ෂිතව හොඳ විශ්වාසයෙන් රිය පදවන ඔහු තම මෝටර්රථයට තෙවන පක්ෂ රක්ෂණ ඔප්පුවක් පමණක් ලබාගෙන ඇත.
අ. තෙවන පක්ෂය යනු කුමක්ද?
ආ. ජීවිත රක්ෂණය හා දේපල රක්ෂණය අතර වෙනස්කම් දෙකක් දක්වන්න. (ලකුණු 02)

(iv) බෙලිඅත්ත ප්‍රදේශයේ පදිංචි පැතුම් මී කිරි නිෂ්පාදනය කර, අලෙවි කිරීමෙන් ඉහළ ආදායමක් උපයා ගන්නෙකි. තම ගම් ප්‍රදේශයේ මී කිරි අලෙවි කිරීමට අමතරව කොළඹ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකු සඳහා දිනපතා දුම්රියෙන් තම නිෂ්පාදිත කොළඹට එවීම පැතුම්ගේ ආදායම ඉහළ යාමට හේතු විය.
අ. දුම්රිය ප්‍රවාහනයේ වාසි දෙකක් හා අවාසි දෙකක් නම් කරන්න.
ආ. ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ප්‍රවාහනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ව්‍යාපාරයකට ප්‍රවාහනයේ ඇති වැදගත්කම් දෙකක් ලියන්න (ලකුණු 02)
(මුළු ලකුණු 08)

04. (i) අ. "කළමනාකරණය" යනු කුමක්ද?
ආ. කළමනාකරණ කාර්යයක් ලෙස සැලසුම්කරණය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
අ. අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් අතුරෙන් ව්‍යාපාරයට ආදායම් ලබා දෙන එකම විචල්‍ය වන්නේ මිලයි.
ආ. සැලසුම් කළ ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත්, කනතුරු හා වැඩ බෙදා හැරීම සංවිධානකරණයයි.
ඉ. කොටස් වෙළෙඳපළ කටයුතු අධීක්ෂණය හා විධිමත් කිරීම සඳහා ක්‍රියාත්මක වන්නේ කොළඹ කොටස් හුවමාරුවයි.
ඊ. සීමිත සමාගම් විසින් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරනු ලැබේ. (ලකුණු 02 )

(iii) විශ්‍රාමික ගුරුවරයෙකු වන නිහාල් තම කාලය ඵලදායීව යෙදවීම සඳහා අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටින දරුවන්ට අවශ්‍ය ප්‍රශ්න පත්‍ර පොත් සකස් කර කොළඹ දිස්ත්‍රික්කයේ පොත් වෙළඳසැල්වලට අලෙවි කරයි. ආකර්ෂණීය ලෙස සකස් කළ එම ප්‍රශ්න පත්‍ර පොත් සමග ගුරු ජීවිතයේ ලද අත්දැකීම පාදක කර ගනිමින් විෂය මතක තබා ගැනීමේ දී සරල ක්‍රම ඇතුළත් පොත් පිංචක් සිසුන්ට නොමිලයේ ලබා දීමට නිහාල් මහතා කටයුතු කරයි. විෂයන් හයක් සඳහා ප්‍රශ්න පත්‍ර පොත් මුද්‍රණය කර අලෙවිකරණ ඔහු පොත් කට්ටලයම රු. 1 000කට සිසුන් අතට පත් කිරීමට කටයුතු සලසා ඇත.

අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් නම් කර ඉහත සිද්ධිය ඇසුරින් එක් එක් විචල්‍ය සඳහා උදාහරණ සපයන්න.

(ලකුණු 02)

(iv) මුතුමාලි අවදානම් දැරීමට කැමති දිරිය කාන්තාවකි. තමා ඉතිරි කරගත් මුදල් ආයෝජනය කර සාමාන්‍ය කොටස් මිලට ගැනීමට ඇය තීරණය කළාය. රු. 50 බැගින් මිලට ගත් සාමාන්‍ය කොටසක් රු. 60 බැගින් නැවත අලෙවි කර ගැනීමට ඇයට හැකි විය.

ඇ. සාමාන්‍ය කොටස් මිලට ගැනීමේ ප්‍රතිලාභ දෙකක් ලියන්න.

ආ. රු. 50 ක් වූ කොටසක් රු. 60 කට අලෙවි කිරීමෙන් ඇය ලබන ලාභය හඳුන්වන නම කුමක්ද?

(ලකුණු 02)

(මුළු ලකුණු 08)

## 11 කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

05. (i) ඇ. ව්‍යාපාරයක "ආදායම" යනු කුමක්ද?

ආ. කේවල ස්වාමි ව්‍යාපාරයක හිමිකම වෙනස් වන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

ඇ. අසංකට ණයට භාණ්ඩ විකුණුම් රු. 12 000

ආ. ව්‍යාපාරයේ ණයගැතියෙකු වූ අචින්තගෙන් ලැබිය යුතු රු. 4 000 ණය පියවීමේ දී 10% වට්ටමකට යටත්ව මුදල් ලැබීම.

(ලකුණු 02)

(iii) කාංචනගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපෑ ආකාරය පහත දැක්වේ.

| ගනුදෙනු | වත්කම් | | | | හිමිකම | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|
| | යන්ත්‍ර | බඩුතොග | ණයගැතියෝ | මුදල් | | බැංකු ණය | ණයහිමියෝ |
| 1 | | | | +500 000 | +500 000 | | |
| 2 | | +20 000 | | | | | +20 000 |
| 3 | +100 000 | | | -100 000 | | | |
| 4 | | -8 000 | +10 000 | | +2 000 | | |
| 5 | | | | +50 000 | | +50 000 | |

අවශ්‍ය වන්නේ,

ඇ. 2, 3, 4, 5 ගනුදෙනු විස්තර සහිතව ලිවීම.

ආ. ගනුදෙනු සියල්ල සමීකරණයට ආදේශ කිරීමෙන් පසු ව්‍යාපාරයේ මුළු වත්කම්වල අගය දැක්වීම.

(ලකුණු 04)

...ම පමුණුව මාර්ගයේ අංක 207 දරණ ස්ථානයේ [illegible] ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සාලියගේ ව්‍යාපාරයේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| දිනය | ඉන්. අංකය | ගැනුම්කරු | වටිනාකම රු. |
|---|---|---|---|
| 2021.12.03 | 53 | මංජුල | 20 000 |
| 2021.12.12 | 54 | වාසනා | 26 500 |
| 2021.12.21 | 55 | අරංගල | 18 000 |
| 2021.12.31 | 56 | මධුශා | 15 500 |

අවශ්‍ය වන්නේ,

අ. 2021.12.31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් ජර්නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.

ආ. පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ වාසි දෙකක් ලියන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 12)

06. (i) අ. සුළු මුදල් අග්‍රිම ක්‍රමය හඳුන්වන්න.

ආ. බැංකු අයිරාව යනු කුමක්ද?

(ලකුණු 02)

(ii) පහත දැක්වෙන්නේ රුවන්ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ගිණුම් ශේෂ කිහිපයකි. එම ශේෂයන් උපයෝගී කර ගෙන ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න.

| | රු. |
|---|---|
| බඩුතොගය | 15 000 |
| බැංකු ණය | 50 000 |
| විදුලි ගාස්තු | 4 000 |
| ලද වට්ටම | 6 000 |
| මුදල් ශේෂය | 80 000 |
| බැංකු ශේෂය | 40 000 |
| ප්‍රාග්ධනය | 83 000 |

(ලකුණු 02)

(iii) උදිත වීරසිංහගේ ව්‍යාපාරයේ 2022 ජනවාරි 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු.28 480කි. එම ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග සමාන නොවීය. වෙනසට හේතු පහත දැක්වේ.

I. තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 8 200කි.
II. බැංකුවට සෘජුවම ලද ලාභාංශ රු. 10 000කි.
III. බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකු ගාස්තු රු. 500කි.
IV. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 4 500කි.

අවශ්‍ය වන්නේ,

අ. 2022.01.31 දිනට සංශෝධිත බැංකු ගිණුම

ආ. 2022.01.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය

(ලකුණු 04)

(iv) යමුනාගේ ව්‍යාපාරයේ තොරතුරු පහත දැක්වේ.

- සුළු මුදල් අග්‍රිමය රු. 3000
- 2022 ජනවාරි මාසයේ සුළු මුදල් ගෙවීම්වල එකතුව රු. 2600කි.
- 2022 පෙබරවාරි මාසයේ 01 දිනට සුළු වියදම් ප්‍රතිපූරණය සිදු විය.

- 2022 පෙබරවාරි සුළු මුදල් ගෙවීම් පහත දැක්වේ.

| දිනය | වවුචර් අංකය | විස්තරය | රු. |
|---|---|---|---|
| පෙබ.02 | ව. අ. 01 | ගමන් ගාස්තු | 150 |
| පෙබ.06 | ව. අ. 02 | දුමින්දට වැටුප් අත්තිකාරම් | 600 |
| පෙබ.10 | ව. අ. 03 | පිරිසිදු කිරීමේ කුළී | 200 |
| පෙබ.14 | ව. අ. 04 | පැන් පැන්සල් | 180 |
| පෙබ.18 | ව. අ. 05 | සිසිල් බීම | 300 |
| පෙබ.23 | ව. අ. 06 | A4 කඩදාසි | 250 |
| පෙබ.25 | ව. අ. 07 | බස්කුළී | 80 |
| පෙබ.28 | ව. අ. 08 | කේක් | 280 |
| පෙබ.28 | ව. අ. 09 | බිස්කට් | 350 |

අ. ගමන් , සංග්‍රහ, ලිපි ද්‍රව්‍ය, විවිධ යන විශ්ලේෂණ තීරු සහිතව සුළු මුදල් පොත පිළියෙල කර, අග්‍රිමය ප්‍රතිපූරණය කරන්න.

ආ. විශ්ලේෂණ තීරුවල එකතුව ලෙජරයට පිටපත් කරන්න. (ලකුණු 4)

(මුළු ලකුණු 12)

07. (i) අ. ක්ෂයවීම යනු කුමක්ද?

ආ. ලාභ අරමුණුකර නොගත් සංවිධානයක අරමුණු මොනවාද? (ලකුණු 02)

(ii) ජය සතුට ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200කි. එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 300කි. 2021 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

ජය සතුට ක්‍රීඩා සමාජය
2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 1/1 | ශේෂය ඉ/ගෙ | | 12 000 | | ලිපි ද්‍රව්‍ය | | 2 000 |
| | සාමාජික මුදල් | | 40 000 | | ගොඩනැගිලි කුළී | | 5 000 |
| | බැංකු ණය | | 50 000 | | පත්තර මිලට ගැනුම් | | 1 000 |
| | පරිත්‍යාග | | 20 000 | | සංග්‍රහ වියදම් | | 3 000 |
| | පත්තර විකිණීම | | 3 000 | | ක්‍රීඩා උපකරණ මිලට ගැනුම් | | 6 000 |
| | | | | | බැංකු ණය පොළී | | 5 000 |
| | | | | 12/31 | ශේෂය ප/ගෙ | | 103 000 |
| | | | 125 000 | | | | 125 000 |
| 2/1 | ශේෂය ඉ/ගෙ | | 103 000 | | | | |

වශා වන්නේ,

2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කරන්න. (ලකුණු 02)

(iii) රංජිත්ගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක් වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| තොගය (2021.01.01 දිනට) | 10 000 | |
| ප්‍රාග්ධනය | | 600 000 |
| ගැනුම් | 150 000 | |
| විකුණුම් | | 400 000 |
| ණයගැතියෝ | 40 000 | |
| ණයහිමියෝ | | 36 000 |
| 10% බැංකු ණය | | 60 000 |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | 500 000 | |
| රථවාහන (පිරිවැයට) | 400 000 | |
| දුන් වට්ටම් | 2 000 | |
| ලද වට්ටම් | | 4 000 |
| ලැබූ ගෙවල් කුලී | | 15 000 |
| වරිපනම් | 3 000 | |
| රක්ෂණ ගාස්තු | 6 000 | |
| සේවක වේතන | 30 000 | |
| ප්‍රචාරණය | 4 000 | |
| මුදල් ශේෂය | 25 000 | |
| බැංකු ශේෂය | | 55 000 |
| | 1 170 000 | 1 170 000 |

අමතර තොරතුරු

- 2021.12.31 දිනට තොගය රු. 20 000
- ඉඩම් හා ගොඩනැගිලි, රථවාහන සරලමාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතු ය.
- උපචිත වරිපනම් ගාස්තුව රු. 2 000කි.

අවශ්‍ය වන්නේ,

අ. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04)

ආ. 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු 04)

(මුළු ලකුණු 12)

## වර්ෂ අවසාන ඇගයීම - 2021
# 11 ශ්‍රේණිය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

### 1 පත්‍රය - පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1 | 11. | 3 | 21. | 1 | 31. | 2 |
| 2. | 2 | 12. | 2 | 22. | 1 | 32. | 3 |
| 3. | 3 | 13. | 1 | 23. | 4 | 33. | 4 |
| 4. | 3 | 14. | 3 | 24. | 2 | 34. | 3 |
| 5. | 4 | 15. | 2 | 25. | 3 | 35. | 1 |
| 6. | 2 | 16. | 2 | 26. | 2 | 36. | 2 |
| 7. | 1 | 17. | 3 | 27. | 4 | 37. | 2 |
| 8. | 1 | 18. | 2 | 28. | 3 | 38. | 4 |
| 9. | 3 | 19. | 1 | 29. | 4 | 39. | 1 |
| 10. | 1 | 20. | 4 | 30. | 1 | 40. | 2 |

(ලකුණු 1*40 = 40)

## 11 පත්‍රය - පිළිතුරු

01. (i) අ. ආහාර
ආ. ඒකපුද්ගල ව්‍යාපාර

(ii)

| පරිසර සාධක | ඇල්මක් දැක්වීමට හේතු |
|---|---|
| අයිතිකරු | ප්‍රමාණවත් ලාභයක් ලැබීම. |
| සේවකයා | සාධාරණ වැටුප් ලබා ගැනීම. |

ඊට අදාල නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු පිරිනමන්න.

(iii) අ. මාර්ගය - මහා මාර්ග
මාධ්‍ය - ලොරි රථය
ආ. ශක්තිය - අයිතිකරු ආහාර තාක්ෂණ ඩිප්ලෝමාවක් හදාරා තිබීම.
අවස්ථාව- ජනතාවගේ කාර්යය බහුලත්වය

(iv) අ. 1918 අංක 06 ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනත
ආ. අඛණ්ඩ පැවැත්මක් නැත.
නීතිමය පුද්ගලභාවයක් නැත.
ගැලපෙන නිවැරදි පිළිතුරකට ලකුණු පිරිනමන්න.

(v) අ. රු. 1000 000
ආ. රු. 50 000

(vi) මුදල් පොත, බැංකු ගිණුම

(vii) අ. බැංකු ගිණුම හර
මුදල් පොත බැර

ආ.

මුදල් ගිණුම

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | 200 000 | එළවළු ගැණුම් | 380 000 |
| බැංකු ණය | 50 000 | පළා වර්ග මිලට ගැනුම් | 20 000 |
| එළවළු විකුණුම් | 600 000 | ඇසුරුම් | 10 000 |
| පළා වර්ග විකුණුම් | 100 000 | යන්ත්‍ර | 25 000 |
| | | සේවක වැටුප් | 10 000 |
| | | ඉන්ධන වියදම් | 12 000 |
| | | රියදුරු වැටුප් | 20 000 |
| | | 6/30 ශේෂය ප/ගෙ | 473 000 |
| | 950 000 | | 950 000 |
| 7/1 ශේෂය ඉ/ගෙ | 473 000 | | |

(viii) අ. රු. 8 000
ආ.

පොදු ජර්නලය

| දිනය | චවු. අංකය | විස්තරය | ලෙ.පි. | හර රු. | බැර රු. |
|---|---|---|---|---|---|
| 6/30 | | ලොරි රථ ක්ෂය හර<br>ලොරි රථ ක්ෂය වෙන් කිරීමේ ගිණුම<br>(ලොරි රථයේ මාසික ක්ෂය ගිණුම්ගත කිරීම) | | 8 000 | 8 000 |

(ix)

| පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. |
|---|---|---|
| 800 000 | 8 000 | 792 000 |
| 25 000 | 125 | 24 875 |
| ධාරණ අගය | | 816 875 |

(x) රු. 239 875/-

(ලකුණු 2 x 10 = 20)

# 1 කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) අ. මිනිස් අවශ්‍යතා සපුරාලීමට අශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි. (ලකුණු 01)

ආ. 1. ලාභ ඉපැයීම 2. පාරිභෝගික තෘප්තිය ඉහල නැංවීම. (ලකුණු 01)

(ii) අ. අසත්‍ය
ආ. සත්‍ය
ඉ. අසත්‍ය
ඊ.සත්‍ය (ලකුණු 02)

(iii) අ. අයිතිකරුවන් සේවකයන්
ගනුදෙනුකරුවන් තරගකරුවන් (ලකුණු 01)

ආ. - සහල් එලවළු මිල ඉහල යාම නිසා සහන මිලට ආහාර අලෙවි කිරීමේ ගැටළුව
-තරගකරුවන්ගේ අලෙවි ප්‍රවර්ධන ක්‍රම නිවැරදි කරුණු දෙකකට ( ලකුණු 01)

(iv) අ. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක සංවිධානය කරමින් යම් නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර පවත්වාගෙන යාමේ කාර්යය ව්‍යවසායකත්වය නම් වේ.

ආ. 1. රජයේ මූල්‍ය නීති, ආයතන සංග්‍රහය, චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට සිදු වීමෙන් තීරණ ගැනීමේ ස්වාධීනත්වය නැති වීම.

2. ශ්‍රම පිරිවැය වැඩි වීම. (ලක්‍රුණු 01) (මුළු ලකුණු 08)

03.(i) අ. අවදානම් ඒකරාශී කර එක් පාර්ශවයකට සිදුවන හානිය හෝ පාඩුව සාමුහිකව බෙදා ගැනීම රක්ෂණය නම් වේ. (ලකුණු 01)

ආ. රක්ෂ්‍ය හිමිකම, උපරිම විශ්වාසය, හානිපූරණය කරුණු 2කට ලකුණු 01

(ii) අ. අසත්‍ය
ආ. අසත්‍ය
ඉ. සත්‍ය
ඊ. සත්‍ය ලකුණු 02

(iii) අ. රක්ෂණ ගිවිසුමෙන් බලපෑමක් වන අනෙකුත් සියලුම පාර්ශව වේ. ලකුණු 01

ආ.

| ජීවිත රක්ෂණය | දේපල රක්ෂණය |
|---|---|
| 1. හානිපූරණ මූලධර්මය බල නොපායි. | 1. හානිපූරණ මූලධර්මය බලපායි. |
| 2. රක්ෂණ ඔප්පුවේ වටිනාකම රක්ෂිතයාගේ අවදානම හා ගෙවීමේ හැකියාව අනුව තීරණය වේ. | 2. දේපලෙහි මූල්‍ය වටිනාකම අනුව තීරණය වේ. |

(කරුණු දෙකකට ලකුණු 01)

(iv) අ. වාසි

1. විශාල භාණ්ඩ හා මගීන් ප්‍රමාණයක් රැගෙන යා හැක.
2. මාර්ග තදබදයක් ඇති නොවේ.

අවාසි

1. ගමනාන්තය දක්වා බොහෝ විට යොදාගත නොහැක.
2. අනතුරක් සිදුවුවහොත් මාර්ගය යථාතත්වයට පත් කිරීමට දිගු කාලයක් ගත වේ.

ගැලපෙන පිළිතුරකට ලකුණු දෙන්න. (ලකුණු 01)

ආ. - භාණ්ඩ වෙළඳපළට බෙදා හැරීමට.
-සේවක ප්‍රවාහනයට
-නිෂ්පාදන සම්පත් ලබා ගැනීමට

ගැලපෙන පිළිතුරකට කරුණු දෙකකට (ලකුණු 01)

04. (I) අ. ව්‍යාපාර අරමුණු සඵලදායීව ඉටුකර ගැනීම සඳහා පවතින සම්පත් කාර්යක්ෂමව යොදා ගනිමින් එම ව්‍යාපාරය සැලසුම් කිරීමේ, සංවිධානය කිරීමේ, මෙහෙයවීමේ සහ පාලනය කිරීමට අදාල ක්‍රියාවලියයි. (ලකුණු 01)

ආ. ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම සහ අරමුණු ඉටු කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලිය සැලසුම්කරණයයි. (ලකුණු 01)

(II) අ. සත්‍යය
ආ. සත්‍යය
ඉ. අසත්‍යය
ඊ. අසත්‍යය ලකුණු 02

(III) නිෂ්පාදිතය - ප්‍රශ්න පත්‍ර පොත්
මිල -රු. 1000
ස්ථානය -කොළඹ දිස්ත්‍රික්කයේ පොත් වෙළඳසැල් (නිහාල් පොත් අලෙවිය)→
ප්‍රවර්ධනය - කෙටි සටහන් පොත් පිංච නොමිලයේ ලබා දීම. ලකුණු 02

(IV) අ. -ලාභාංශ ආදායම් ලැබිය හැක.
-ප්‍රාග්ධන ලාභ ලබාගත හැක.
-එය ලබා ගැනීමේදී ඇප සුරැකුම් ලෙස භාවිතා කල හැකි වීම.

අදාල නිවැරදි ප්‍රතිලාභ 2ක් ලියා ඇත්නම් ප්‍රමාණවත් වේ. ලකුණු 01

ආ. ප්‍රාග්ධන ලාභ ලකුණු 01 (මුළු ලකුණු 08)

05.
(I) අ. අයිතිකරුවන් යොදන ප්‍රාග්ධනය නිසා හිමිකමෙහි සිදු වන වැඩිවීම හැර හිමිකමෙහි සිදු වන අනෙකුත් වැඩිවීම් ආදායම් ලෙස හැඳින්වේ.

ලකුණු 1

ආ. අමතර ප්‍රාග්ධනය යෙදීම.

ගැනිලි, ආදායම් වියදම් කරුණු දෙකකට ලකුණු 01

(II) අ. ණයගැති අසංක හර රු. 12 000
විකුණුම් ගිණුම බැර රු. 12 000

ආ. මුදල් ගිණුම හර රු. 36 00
දුන් වට්ටම් ගිණුම හර රු. 400
ණයගැති අචින්ත බැර රු. 4 000 ලකුණු 02

(III) අ. 2. රු. 20 000ක භාණ්ඩ ණයට ගැනීම.
3. රු. 100 000ක යන්ත්‍රයක් මිලට ගැනීම.
4. රු. 8 000ක් පිරිවැය වූ භාණ්ඩ රු. 10 000කට ණයට විකිණීම.
5. බැංකු ණයක් ලබා ගත්තා. රු. 50 000

ආ. රු. 572 000 ලකුණු 04

(Iv) අ. විකුණුම් ජර්නලය

| දිනය | ඉ.අ. | ගැනුම්කරු | මුළු වටිනාකම රු. | ලෙ.පි. |
|---|---|---|---|---|
| 12/2 | 53 | මංජුල | 20 000 | |
| 12/12 | 54 | වාසල | 26 500 | |
| 12/21 | 55 | අරංගල | 18 000 | |
| 12/31 | 56 | මධුෂා | 15 500 | |
| 12/31 | විකුණුම් ගිණුමට බැර කලා | | 80 000 | |

විකුණුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| | | | | 12/31 | ණයගැතියෝ | | 80 000 |
| | | | | | | | |

මංජුල

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 12/3 | විකුණුම් | | 20 000 | | | | |
| | | | | | | | |

වාසනා

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 12/12 | විකුණුම් | | 26 500 | | | | |
| | | | | | | | |

අරංගල

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 12/21 | විකුණුම් | | 18 000 | | | | |
| | | | | | | | |

මධුෂා

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 12/31 | විකුණුම් | | 15 500 | | | | |
| | | | | | | | |

ඇ.

- ගිණුම් වාර්තා ස්වයංක්‍රීයව පිළියෙල කරගත හැක. කාලය ඉතිරි වේ.
- අවශ්‍ය ශ්‍රමය අවම වීම තුලින් මුදල් ඉතිරි වීම.
- ස්වයංක්‍රීයව ගිණුම් වාර්තා නිමවන නිසා නිරවද්‍යතාව ඉහල වීම.
- කාලීන දත්ත පහසුවෙන් ලබා ගත හැකි වීම.

ලකුණු 04 (ලකුණු 12)

06.

(I) අ. පාලනයකින් යුතුව සුළු වියදම් පවත්වාගෙන යම සඳහා ප්‍රධාන මුදල් භාරකරු සුළු මුදල් භාරකරුට යම් නිශ්චිත මුදලක් ලබාදෙන අතර අග්‍රිමය අවසාන වීමට ආසන්න වූ විට වියදම් කල මුදලට සමාන මුදලක් ලබා දෙමින් කටයුතු කිරීම සුළු මුදල් අග්‍රිම ක්‍රමය නම් වේ. (ලකුණු 1)

ආ. ජංගම ගිණුමේ පවතින ශේෂය ඉක්මවා චෙක්පත් නිකුත් කලවිට බැංකුව එම චෙක්පත් වලට ගෙවීම් කිරීම නිසා ගිණුම් හිමියා බැංකුවට ණයගැති වන අගය බැංකු අයිරාව නම් වේ. (ලකුණු 1)

(II) අ.

රුවනිගේ ව්‍යාපාරය
2021.12.31 දිනට ශේෂ පිරික්සුම

| විස්තරය | හර රු. | බැර රු. |
|---|---|---|
| බඩුතොගය | 15 000 | |
| බැංකු ණය | | 50 000 |
| විදුලි ගාස්තු | 4 000 | |
| ලද වට්ටම් | | 6 000 |
| මුදල් ශේෂය | 80 000 | |
| බැංකු ශේෂය | 40 000 | |
| ප්‍රාග්ධනය | | 83 000 |
| | 139 000 | 139 000 |

ලකුණු 2

(III) අ. සංශෝධිත බැංකු ගිණුම

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 1/31 | ශේෂය ඉ/ගෙ | | 28 480 | | බැංකු ගාස්තු | ½ | 500 |
| | ලාභාංශ | 1/2 | 10 000 | 1/31 | ශේෂය ප/ගෙ | ½ | 37 980 |
| | | | 38 480 | | | | 38 480 |
| 2/1 | ශේෂය ඉ/ගෙ | | 37 980 | | | | |

ආ. බැංකු සැසඳුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| 1/31 සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය | ½ | 37 980 |
| එකතු කලා | | |
| ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | ½ | 4 500 |
| | | 42 480 |
| අඩු කලා | | |
| නිශ්කාශනය නොවූ චෙක්පත් | ½ | (8 200) |
| 1/31 බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය | 1/2 | 34 280 |

ලකුණු 04

(Iv)

සුළු මුදල් පොත

| ලැබීම් | ස.පි. | දිනය | විස්තරය | ව.අ. | ගෙවීම් රු. | විශ්ලේෂණ තීරු | | | | ලෙ.ගි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ගමන් | සංග්‍රහ | ලිපිද්‍රව්‍ය | විවිධ | |
| 400 | | 2/1 | ශේෂය ඉ/ගෙ | | | | | | | |
| 2600 | | | අග්‍රිමය ප්‍රතිපූරණය | | | | | | | |
| | | 2/2 | ගමන් ගාස්තු | 01 | 150 | 150 | | | | ½ |
| | | 2/6 | දුමින්දට වැටුප් අත්තිකාරම් | 02 | 600 | | | | | 600 |
| | | 2/10 | පිරිසිදු කිරීමේ කුලී | 03 | 200 | | | | 200 | |
| | | 2/14 | පෑන් පැන්සල් | 04 | 180 | | | 180 | | |
| | | 2/18 | සිසිල් බීම | 05 | 300 | | 300 | | | |
| | | 2/23 | A4 කඩදාසි | 06 | 250 | | | 250 | | |
| | | 2/25 | බස් කුලී | 07 | 80 | 80 | | | | |
| | | 2/28 | කේක් බිස්කට් | 08 | 280 | | 280 | | | |
| | | | විවිධ වියදම් | 09 | 350 | | | | 350 | |
| | | | | ½ | 2390 | 230 | 580 | 430 | 550 | 600 |
| | | 2/28 | ශේෂය ප/ගෙ | ½ | 610 | | | ½ | | |
| 3 000 | | | | | 3 000 | | | | | |
| 610 | ½ | 3/1 | ශේෂය ඉ/ගෙ | | | | | | | |
| 2390 | ½ | | අග්‍රිමය ප්‍රතිපූරණය | | | | | | | |
| | | | | | | | | | | |

ගමන් ගාස්තු

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2/28 | සුළු මුදල් | | 230 | | | | |
| | | | | | | | |

සංග්‍රහ වියදම්

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2/28 | සුළු මුදල් | | 580 | | | | |
| | | | | | | | |

ලිපි ද්‍රව්‍ය

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2/28 | සුළු මුදල් | | 430 | | | | |
| | | | | | | | |

විවිධ වියදම්

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2/28 | සුළු මුදල් | | 550 | | | | |
| | | | | | | | |

දුමින්ද

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2/6 | සුළු මුදල් | | 600 | | | | |
| | | | | | | | |

ලෙජර ගිණුම් සඳහා ලකුණු 01
ලකුණු 04 මුළු ලකුණු 12

07.

(I) අ. ජංගම නොවන වත්කමක ඵලදායී ජීවිත කාලය තුල භාවිතය හෝ යල්පැනීම නිසා අගය අඩු වූ ප්‍රමාණය ක්ෂය ලෙස හැඳින්වේ. ලකුණු 01

ආ. -සාමාජික සුභ සාධනය හා අභිවෘද්ධිය
- සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීම. ලකුණු 01

(II)

ජය සතුට ක්‍රීඩා සමාජයේ
2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 1/2
ආදායම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| (+) ආදායම් | | |
| සාමාජික මුදල් 1/2 | 60 000 | |
| පරිත්‍යාග | 20 000 | |
| පත්තර විකිණීම | 3 000 | 83 000 |
| | | |
| (-) වියදම් | | |
| ලිපි ද්‍රව්‍ය | 2 000 | |
| ගොඩනැගිලි කුළී | 5 000 | |
| පත්තර මිලට ගැනුම් | 1 000 | |
| සංග්‍රහ වියදම් | 3 000 | ½ |
| ණය පොළී | 5 000 | (16 000) |
| අතිරික්තය ස.අ.මා. | | ½ 67 000 |
| | | |

(ලකුණු 2)

(III).

රංජිත්ගේ ව්‍යාපාරයේ
2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ ප්‍රකාශනය ½

| | | | |
|---|---|---|---|
| විකුණුම් | | | 400 000 |
| **(-)විකුණුම් පිරිවැය** | | | |
| තොග 2021.01.01 | | 10 000 | |
| ගැනුම් | | 150 000 | |
| විකිණීමට ඉදිරිපත් කල භාණ්ඩ වල පිරිවැය | | 160 000 | |
| (-) අවසාන තොගය | ½ | (20 000) | |
| විකුණුම් පිරිවැය | | | (140 000) |
| දළ ලාභය | | ½ | 260 000 |
| **(+) වෙනත් ආදායම්** | | | |
| ලද වට්ටම් | | 4 000 | ½ |
| ලැබූ ගෙවල් කුළී | | 15 000 | 19 000 |
| | | | 279 000 |
| **(-) වියදම්** | | | |
| **බෙදාහැරීමේ වියදම** | | | |
| රථවාහන ක්ෂය | 40 000 | ½ | |
| දුන් වට්ටම් | 2 000 | | |
| ප්‍රවරණය | 4 000 | 46 000 | |
| | | | |
| **පරිපාලන වියදම්** | | | |
| ඉඩම්ගොඩනැගිලි ක්ෂය | 50 000 | ½ | |
| වරිපනම් ගාස්තු | 5 000 | ½ | |
| රක්ෂණ ගාස්තු | 6 000 | | |
| සේවක වේතන | 30 000 | 91 000 | |
| | | | |
| **මූල්‍ය වියදම්** | | | |
| බැංකු ණය පොළී | 6 000 | 6 000 | (143 000) |

| | | | | |
|---|---|---|---|---|
| ශුද්ධ ලාභය ප්‍රා/ගි/මාරු කලා | | | ½ | 136 000 |

(IV).

රංජිත්ගේ ව්‍යාපාරයේ
2021.12.31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ½

| ජංගම නොවන වත්කම් | පිරිවැය රු. | සමුච්චිත ක්ෂය රු. | ධාරණ අගය රු. |
|---|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 500 000 | 50 000 | 450 000 |
| රථවාහන 1/2 | 400 000 | 40 000 | 360 000 |
| | 900 000 | 90 000 | 810 000 |
| **ජංගම වත්කම්** | | | 1/2 |
| අවසාන තොගය | ½ | 20 000 | |
| ණයගැතියෝ | | 40 000 | |
| මුදල් | | 25 000 | 85 000 |
| **මුළු වත්කම්** | | | **895 000** |
| | | | |
| **හිමිකම් හා වගකීම්** | | | |
| ප්‍රාග්ධනය | | 600 000 | 1/2 |
| (+) ශුද්ධ ලාභය | 1/2 | 136 000 | 736 000 |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය | | | 600 000 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ණයපොලී | ½ | 6 000 | |
| උපචිත වරිපනම් | | 2 000 | |
| ණයහිමියෝ | | 36 000 | |
| බැංකු ශේෂය | 1/2 | 55 000 | 99 000 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | | **895 000** |

ලකුණු 04
මුළු ලකුණු 12